මගේ අංකය ;- MPS/01/07
எனது இல ;-
My No :-
ඔබේ අංකය :-
உனது இல :-
Your No :-

**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව -** මාලිම්බඩ
**மாலிம்பட பிரதேச சபை - மாலிம்பட**
**MALIMBADA PRADESHIYA SABHA - MALIMBADA**

දිනය :- 2022.09.15
திகதி :-
Date :-

දු.ක./ෆැක්ස් தொலைபேசி/ தொலைநகல் Telephone / Fax:- 041-2240208

# මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
# 2022.09.13 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
ගරු මන්ත්‍රී රවිත මොහොට්ටි මහතා
ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා
ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා

නොපැමිණීම:- ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2022 සැප්තැම්බර් මස මාසික සභා රැස්වීම 2022.09.13 දින ගරු සභාපති සෝමසිරි වීරමන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.00 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ කරන ලදී.

***01.පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.***

2022 අගෝස්තු මස 09 වන දින පැවති මහා සභාවේ වාර්තාව සභා සම්මත කිරීමට
යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව 2022.08.09 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

2022.08.26 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීමට

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව 2022.08.26 දින පැවති විශේෂ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

***02. සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන***

***03. සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.***

- පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය , මාතර මගින් එවන ලද "ප්‍රාදේශීය සභා උප කාර්යාලයක් පිහිටුවීම සම්බන්ධවයි " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- නො.124/16/3,අකුරැස්ස පාර, මාලිම්බඩ, පාලටුව මගින් එවන ලද "ගල්ඇන්දකුට්ටිය ප්‍රජා ශාලාව ඉදිකිරීමේ කර්මාන්තය සම්බන්ධවයි " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- සරණ වැඩිහිටි සමිතිය,මාලිම්බඩ බටහිර මගින් එවන ලද "කර්මාන්ත මුදල් ලබා ගැනීම සම්බන්ධවයි " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- තෙලිජ්ජවිල, කැකුණවෙල, සුජාතා පෙර පාසල, එම්.පී.දීප්තිකා නිරෝෂනී විසින් ඉදිරිපත් කර තිබූ " අබලන් වූ ගොඩනැගිල්ල සම්බන්ධවයි " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලිම්බඩ මගින් එවා තිබූ " නිල කාර්යාලයක් ලබා ගැනීම සඳහා " යන හිසින් යුත් ලිපි සභාගත කරන ලදී.
- විදුහල්පති, මාර/දම්පැල්ල ම.වි., තෙලිජ්ජවිල විසින් එවන ලද "නාය යන ලද පස්කන්ද වැඩ අවසන් කර ගැනීම " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් එවන ලද " සම්පූර්ණයෙන් වැඩ අවසන් නොකරන ලද ව්‍යාපෘතිවල දිගුකාලීන පැවැත්ම තහවුරු කිරීම " යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- හොරගොඩ ප්‍රදේශවාසීන් විසින් එවන ලද "අලපලාව කෘෂි පාර අවහිර වීම සම්බන්ධවයි." යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලිම්බඩ මගින් එවා තිබූ " නව නිපයුම් නිෂ්පාදන හඳුනා ගැනීම " යන හිසින් යුත් ලිපි සභාගත කරන ලදී.

***04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත.***

***05. යථා පරිදි කල්දී ඇති යෝජනා***

<u>**යෝජනා අංක 5:1**</u>

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>

මේ අයවැය ලේඛනය සකස් කිරීමේදී අපි ඔබ සියලුදෙනාගේම , ස්වේච්ඡා සංවිධානවල ,කාර්යය මණ්ඩලයේ ,අදහස් විමසුවා.අයවැය කෙටුම්පත ඉදිරිපත් කරල මන්ත්‍රීවරු සියලු

දෙනාගෙන්ම අදහස් ගත්තා.ඒ අදහස් අනුව අපි මේ අයවැය ලේඛනය සකස් කරල තියෙනවා.මේ අයවැය ලේඛනය සකස් කිරීමේදී අනවශ්‍ය වියදම් ඉවත් කරල බොහොම සරලව අඩු වියදමකින් සකස් කරන්න අපි හැමෝම තීරණය කළා.ඒ අනුව තමයි මේ අයවැය ලේඛනය ඉතා වාම්ව අත්‍යවශ්‍ය දේවල් පමණක් ඇතුළත් කරල සකස් කරල තමුන්නාන්සේලා අතට පත්කරේ.

වසර දෙකකට වැඩි මේ කාලය අපි ලොකු ගැටලුවලට මුහුණ දුන්න කාලයක්.මොකද අපේ සභාව ආරම්භ කරපු අවස්ථාවේ තිබුණේ අපට පක්ෂපාතී ආණ්ඩුවක් නෙමෙයි.වසර දෙකකට වැඩි කාලයක් අපි සමග සම්බන්ධකම් නොපවත්වපු ආණ්ඩුවක් තමයි අපිට පාලනය කරගෙන යන්න හැකියාව ලැබුණේ.ඒ වගේම අපේ ආණ්ඩුව කොරෝනා වසංගතයට මුහුණ දුන්නා. මේ වෙනකොට ඉතා දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ දෙමින් ඉන්නවා.මේ සියල්ල අතරතුර අපි ලොකු වැඩ කොටසක් කරල තියෙනවා.අනෙක් සභා සමග සංසන්දනය කරල බලන කොට  අපි ඉදිරියෙන්ම ඉන්නවා කියන එක මම මතක් කරනවා.මොකද අපට විවිධ චක්‍රලේඛ ආවා.ඒ චක්‍ර ලේඛන, සීමා බැඳීම් සියල්ල ආවත් උපක්‍රමශීලීව විවිධ සේවාවන් සපයන්න අපට හැකියාව ලැබුණා.ඒ අනුව ඒ වසංගත කාලය තුළ අපි විශේෂ කටයුතු කීපයක්ම ක්‍රියාත්මක කළා.එළවලු ලබා දුන්නා.අවශ්‍ය දේවල් ලබා දුන්නා.ඒ තුළින් මිනිස්සුන්ට ලොකු සේවාවක් කළා.ඒ වගේම ගෙවතු වගා වැඩසටහන යටතේ විශාල ප්‍රමාණයකට පැළ ලබා දුන්නා.මේ වෙනකොට ගෙවතු දස දහසකට වැඩි ප්‍රමාණයකට අපි පැළ ලබා දීල තියෙනවා.ඒ එක්කම දැනට අපි ජපන් භාෂා පන්ති පවත්වාගෙන යනවා.මේක ලංකාවේ පළමුවෙන්ම ප්‍රාදේශීය සභාවක් පටන් ගත් ජපන් භාෂා පාඨමාලාව.අපෙන් දැන් වෙනත් ආයතන උපදෙස් ගන්නවා ඒ ආයතනවලත් මේ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න.ඒ වගේම වෘත්තීය පුහුණු වැඩසටහන් අපි කළා. මේ ආදී වශයෙන් අපට කරන්න පුලුවන් සියලුම දේ ප්‍රා දේශීය සභාවක් වශයෙන් අපි කරල තියෙනවා.ඒ වගේම අපි ඉදිරි කාලයේදී පෙරපාසල් සංවර්ධනයට අදාළ දේ අත්‍යවශ්‍ය සංවර්ධන කටයුතු , ආදාහනාගාරය ඉදිකිරීම , කෘෂිකාර්මික සංවර්ධන කටයුතු අපි මේ අවුරුද්ද තුළ ක්‍රියාත්මක කරන්න බලාපොරොත්තු වෙනවා.ඉතින් ඒ ආකාරයට තමයි 2022 වර්ෂයේ ගෙවී ගිය කාලය තුළ අපි වැඩ කළේ සහ 2022 වර්ෂයේ ඉදිරි කාලය තුළ වැඩ කරගෙන යන්න බලාපොරොත්තු වෙන්නෙ.ඉතින් අපේ ගරු උප සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, අපේ 2023 අයවැය ලේඛනය බැලුවම අපට ළඟා කරගත හැකි ඉලක්කම් ටිකක් තියෙන්නෙ.අපි අතීතයේ ඉදිරිපත් කරපු හැම අයවැය වාර්තාවකම ආදායම් අපි ඉපයුවා.ඒ නිසා මේ අයවැයට දාපු ආදායමත් අපට උපයන්න පුලුවන්.මෙතෙක් පැවති කාලය බැලුවාම අපි ඉතා අඩු ආදායම් මට්ටමක් ලැබූ ප්‍රාදේශීය සභාවක්. එම ආදායම් අඩු ආදායම් මට්ටම ඉක්මවල අපි වැඩි ආදායම් ලබන සභාවක් බවට පත්වෙලා තියෙනවා.අපට මුද්දර ආදායම් ලැබෙනවා.තාම අපට ලැබෙන්නෙ 2021 වර්ෂයේ මුද්දර ආදායම්. 2022 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ඉදිරියේදි ලැබෙයි. අලුත් ජල ගාස්තු සංශෝධනයත් එක්ක පොදු නාන ළිං නඩත්තු කරන්න අපි මුදල් යොදවල තියෙනවා.ඒ වගේම කෘෂිකාර්මික කටයුතුවලට, මාර්ග සංවර්ධනයට සහ අත්‍යවශ්‍ය කටයුතු සඳහා කළින් අවුරුදුවලට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කරල තියෙනවා.

කවුරු බලයට ආවත් අපි අයවැය ලේඛනයක් සම්මත කරල තියන්න ඕන.නැත්නම් ලබන අවුරුද්දෙ වියදම් කිරීම ලොකු ගැටලුවක් වෙනවා. අපි කල්තියා දැනගෙන තමයි මේ වැඩේ කරේ.මේක 2023 වර්ෂයට අදාළ ලංකාවේ පළමු අයවැය ලේඛනය වෙන්නැති. සැප්තැම්බර් මාසයේ විසුරුවා හැරියොත් යන සංකල්පය මත අනාගත දැක්මක් වශයෙන් තමයි  මේ අයවැය ලේඛනය ඉදිරිපත් කළේ.සැප්තැම්බර් මාසෙ පළාත් පාලන ආයතන විසුරුවා හැරියොත් ලබන අවුරුද්දේ මැතිවරණය තියේවි.ලබන අවුරුද්දෙ කවුරු බලයට ආවත්, අපි වෙන්න පුලුවන්,නැත්නම් මෙතන ඉන්න විපක්ෂය වෙන්න පුළුවන්,නැත්නම් තවත් අලුත් විපක්ෂයක් වෙන්න පුලුවන්.කවුරු ආවත්,අපි යමක් කරගෙන යන විදියට කාගෙත් අදහස් අරගෙන කෙටුම්පතෙහි සංශෝධනය කරපුව සියල්ලක්ම අන්තර්ගත කරල ඔබතුමාලගේ අදහස් නැවත අන්තර්ගත කරල තමයි මේ අයවැය වාර්තාව සකස් කළේ.ඉතින් මම හිතනවා

පක්ෂ විපක්ෂ සියලුදෙනාගේම සහභාගීත්වය ඇතිව මේ අවසන් අවුරුද්දේ අයවැය ලේඛනය අනුමත කරයි කියලා. අයවැය කතාවට සවන් දුන් සියලු දෙනාටම ස්තූතිය ප්‍රකාශ කරමින් මම ඔබ සියලු දෙනාටම ආරාධනා කරනවා ඔයාලගේ අදහස් ඉදිරිපත් කරන්න කියලා.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:1</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:2</u>**

2022/08/02 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:2</u>**

2022/08/02 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:3</u>**

2022/08/09 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:3</u>**

2022/08/09 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:4</u>**

2022/08/26 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:4</u>**

2022/08/26 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:5</u>**

තෙලිජ්ජවිල පිහිටි පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ ඉදිරිපස පහළ කොටසේ කාමර 2ක් ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා ලබා දීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**

තෙලිජ්ජවිල ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ ප්‍රාදේශීය සභා උප කාර්යාලයක් පවත්වා ගෙන යාම සඳහා ඉල්ලීම් කළත් අනුමත වූයේ නැහැ. ගොඩනැගිල්ල තුළ ජනතාවට ප්‍රයෝජනවත් වැඩක් කරන්න ඕන නිසා මම මේ යෝජනාව ඉදිරිපත් කරනවා. අද රෝගී ජනතාව ආයුර්වේද වෙත යොමු වෙනවා.වෙනිඅකුල ආයුර්වේද සායන මධ්‍යස්ථානය වෙත දිනෙන් දින රෝගීන් එන ප්‍රමාණය වැඩි වෙනවා.බෙහෙත් අපි නොමිලේ දෙනවා.ජනතාවට ලොකු සහනයක්.මීට අමතරව යෝග වැඩසටහන, විවිධ සායන වැඩසටහන්, ජනතාව දැනුවත් කිරීම්, ගෙවතු වගා වැඩසටහන්,ආරම්භ කරනවා. ඉහත වැඩසටහන් සභා බල ප්‍රදේශයට අනුමත කරගත්තේ බොහොම අමාරුවෙන්. මීට වඩා හොද දෙයක් කරන්න පුළුවන් නම් ඉදිරිපත් කරන්න.

**<u>ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා</u>**

ආයුර්වේද වැඩසටහන් හොදයි.සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය පවත්වා ගෙන යන ඉඩකඩ ප්‍රමාණවත් නැහැ. ගැබිණි මව්වරුන්ට ඉන්න තැනක් නැහැ. ඒ නිසා මෙම ගොඩනැගිල්ල මාලිම්බඩ සෞඛ්‍ය සේවා මධ්‍යස්ථානය සඳහා දීම වඩාත් සුදුසුයි.

**<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා</u>**

කාගෙත් කැමැත්ත ප්‍රාදේශීය සෞඛ්‍ය මධ්‍යස්ථානයට දීම සුදුසුයි කියලා කියනවා නම් ඒ සඳහා ලබා දීම කළ හැකියි. යෝජනාව සංශෝධනය කර ඉදිරිපත් කරමු.

මෙම යෝජනාව පහත පරිදි සංශෝධනය කිරීමට යෝජනා කරමි.

තෙලිජ්ජවිල පිහිටි පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල මාලිම්බඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට බදුකුළී මත ලබා දීමටත්, මාලිම්බඩ පැරණි ප්‍රාදේශීය සභා පුස්තකාල ගොඩනැගිල්ල ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා ලබා දීමටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:5</u>**

තෙලිජ්ජවිල පිහිටි පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල මාලිම්බඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට බදුකුළී මත ලබා දීමටත්, මාලිම්බඩ පැරණි ප්‍රාදේශීය සභා පුස්තකාල ගොඩනැගිල්ල ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා ලබා දීමටත් තීරණය විය.

**<u>යෝජනා අංක 5:6</u>**

මාලිම්බඩ පොළට ඇතුළුවන ස්ථාන සඳහා ආරක්ෂිත ගේට්ටු ඉදිකිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ඉහත යෝජනාව පහත පරිදි සංශෝධනය කිරීමට යෝජනා කරමි.

මාලිම්බඩ පොළට ඇතුළුවන ස්ථාන සඳහා ආරක්ෂිත ගේට්ටු ඉදිකිරීමටත්,තෙලිජ්ජවිල පොළට ඇතුළුවන ස්ථානවල ඇති ගේට්ටු අලුත්වැඩියා කිරීමටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා

__ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය__

ගරු සභාපතිතුමනි මේ යෝජනාව මම ස්ථිර කරනවා. මම දැකල තියෙනවා හැන්දෑවේ හතර හමාරට පහට විතර වගේ සමහර පුද්ගලයන් මත්පැන් පානය කරන්න පොළ ඇතුළට එනවා. ඒ වගේම ඉස්කෝලේ අවසන් වුණාට පස්සේපිරිමි ළමයි කල්ලි වශයෙන් මේක ඇතුළේ ඉන්නවා.එයාල මොනව කරනවද කියල අපි දන්නෙ නැහැ.ඒවගේම හැන්දෑවේ පහ විතර වෙනකොට පොළ ඇතුළේ හරිම කළුවරයි. අද මම සභාවට එන අවස්ථාවෙත් පොළ ඇතුළෙ කිහිප දෙනෙක් හිටියා. මම තවත කෙනෙක් සමග ආවේ.ඒ අවස්ථාවේ කෙනෙක් එතන බැම්ම ආසන්නයේ මුත්‍රා කරනවා. අපට මිනිස්සු ගැන කියන්න බෑ.සමහරවිට ඔය ස්ථානයේ දූෂිත ක්‍රියාකාරකම් වෙන්න පුලුවන්.ඒ නිසා මේ පොළට ගේට්ටු 03ක් සකස් කරන්න ඕන. ඒක දවල් දවසට ඇරල තියන්න ඕන ප්‍රශ්නයකුත් තියෙනවා.මොකද කඩ සංකීර්ණයේ අයට දවල්ට වැසිකිලිය භාවිතා කරන්න ඕන නිසා.ඒ නිසා ඒ ගැනත් සොයල බලන්න.ඒ අනුව මම මේ යෝජනාව ඉතාමත් සුදුසුයි කියල නැවතත් ප්‍රකාශ කරනවා.

__ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා__

සභාපතිතුමා තෙලිජ්ජවිල පොළෙත් ප්‍රධාන ගේට්ටු දෙක දැනට බොහෝ සේ දිරාපත් වෙලා තියෙන්නෙ.එම ස්ථානයේ අපි ඉන්න නිසා පිටස්තර පුද්ගලයින් දුරාචාර ක්‍රියාවන්ට එම ස්ථානයට ඇතුලුවෙන්නෙ නැහැ. නමුත් අපි දකිනවා වෙළෙන්දො පොළ පැවැත්වෙන දිනට කලින් දින ඔවුන්ගේ එළවළු බඩු බාහිරාදිය එම ස්ථානයේ තැන්පත් කරනවා.නමුත් සුනඛයන් සහ වෙනත් සත්තු මේ පොළ භූමියට ඇතුළු වෙනවා.පිටින් කිසිම සත්ත්වයෙකුට ඇතුළුවීමට නොහැකි වුවත් මේ ප්‍රධාන ගේට්ටු දෙක අබලන් වීමේ තත්ත්වය මත සත්තුන්ට ඇතුළුවෙන්න පුලුවන්. සමහර වෙලාවට එළවළු තියෙන තැනට එහා පැත්තෙ ජරාගොඩ.ඒ වෙළෙන්දො ඒව අස්කරල එළවළු දානවා. නමුත් සමහර වෙලාවට එලවළුවලටම ජරා කරල තියෙනවා අපි ඇස්දෙකෙන් දැකල තියෙනවා. ඒ නිසා මේ ගේට්ටු දෙකත් නැවත යථා තත්ත්වයට පත් කරල ආහාරවල සහ වෙළෙන්දන්ගේ සුරක්ෂිතතාවය රකින්න මැදිහත්වෙන්න කියල ගරු සභාපතිතුමාගෙන් මම ඉල්ලනවා.

__ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා__

මීට අමතරව අඩි දෙකක විතර දැලක් වටේට ගැහුවනම් හොඳයි කියල මම යෝජනා කරනවා.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

__තීරණ අංක 5:6__

මාලිම්බඩ පොළට ඇතුළුවන ස්ථාන සඳහා ආරක්ෂිත ගේට්ටු ඉදිකිරීමටත්,තෙලිජ්ජවිල පොළට ඇතුළුවන ස්ථානවල ඇති ගේට්ටු අලුත්වැඩියා කිරීමටත් තීරණය විය.

__යෝජනා අංක 5:7__

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් සේවකයන් ලෙස සේවය කරන පහත නම් සඳහන් අයගේ සේවා කාලය 2022.09.09 දිනෙන් අවසන් වන බැවින් ඔවුන්ගේ සේවා කාලය වසරකින් දීර්ඝ කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

01. ඒ.ඒ.ප්‍රියන්ත මයා - සෞඛ්‍ය කම්කරු
02. එච්.එල්.ගයාන් අමරසිරි කුලරත්න මයා - රියදුරු

03. ඩබ්.ජී. රවි සම්පත් මයා - සෞඛ්‍ය කම්කරු

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:7</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කොන්ත්‍රාත් සේවකයන් ලෙස සේවය කරන පහත නම් සඳහන් අයගේ සේවා කාලය 2022.09.09 දිනෙන් අවසන් වන බැවින් ඔවුන්ගේ සේවා කාලය වසරකින් දීර්ඝ කිරීමට තීරණය විය.

01. ඒ.ජී.ප්‍රියන්ත මයා - සෞඛ්‍ය කම්කරු
02. එච්.එල්.ගයාන් අමරසිරි කුලරත්න මයා - රියදුරු
03. ඩබ්.ජී. රවි සම්පත් මයා - සෞඛ්‍ය කම්කරු

**<u>යෝජනා අංක 5:8</u>**

නො.09, රෝස්මවුන්ට්, තෙලිජ්ජවිල යන ලිපිනයෙහි පදිංචි නන්දකුමාර රණසිංහ යන අය බදු ගිවිසුමක් යටතේ ලබා ගෙන ඇති මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් අංක 37 කඩ කාමරය සඳහා 2022 මැයි මස සිට අගෝස්තු මස දක්වා කඩ කාමර කුළී නොගෙවා රු.44640.00 ක හිඟ මුදලක් පවත්වා ගෙන යන බැවින්ද, බදු ගිවිසුම් කාලය අවසන් වීම හේතුවෙන් ගිවිසුම් අලුත් කිරීමට පැමිණෙන ලෙස දන්වා තිබියදී ගිවිසුම් අත්සන් නොකර ගිවිසුම් කොන්දේසි කඩ කිරීම හේතුවෙන් ද මෙම කඩ කාමරය නැවත සභාව වෙත පවරා ගෙන ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

<u>ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා</u>

ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරන්න. කඩ කාමරයේ බඩු බාහිරාදිය තියෙනව නම් ඒවා ඉවත් කරගන්න කියලා පොලිසියටත් ලිපියේ පිටපතක් දාලා එයාලට දැනුම් දෙන්න.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:8</u>**

නො.09, රෝස්මවුන්ට්, තෙලිජ්ජවිල යන ලිපිනයෙහි පදිංචි නන්දකුමාර රණසිංහ යන අය බදු ගිවිසුමක් යටතේ ලබා ගෙන ඇති මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් අංක 37 කඩ කාමරය සඳහා 2022 මැයි මස සිට අගෝස්තු මස දක්වා කඩ කාමර කුළී නොගෙවා රු.44640.00 ක හිඟ මුදලක් පවත්වා ගෙන යන බැවින්ද, බදු ගිවිසුම් කාලය අවසන් වීම හේතුවෙන් ගිවිසුම් අලුත් කිරීමට පැමිණෙන ලෙස දන්වා තිබියදී ගිවිසුම් අත්සන් නොකර ගිවිසුම් කොන්දේසි කඩ කිරීම හේතුවෙන් ද මෙම කඩ කාමරය නැවත සභාව වෙත පවරා ගෙන ටෙන්ඩර් කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 5:9</u>**

පවත්නා ඉන්ධන අර්බුදය හේතුවෙන් මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් ගෙවීමේ පදනම මත ඉන්ධන ලබා ගැනීමේදී මාතර දිස්ත්‍රික්කයේ ඕනෑම ඉන්ධන පිරවුම්හලකින් ඉන්ධන ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ඉහත යෝජනාව පහත පරිදි සංශෝධනය කිරීමට යෝජනා කරමි.

පවත්නා ඉන්ධන අර්බුදය හේතුවෙන් මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් ගෙවීමේ පදනම මත ඉන්ධන ලබා ගැනීමේදී අනුමත කරඇති ඉන්ධන පිරවුම්හලට අමතරව දිවයිනේ ඕනෑම ඉන්ධන පිරවුම්හලකින් ඉන්ධන ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදූගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:9</u>**

පවත්නා ඉන්ධන අර්බුදය හේතුවෙන් මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් ගෙවීමේ පදනම මත ඉන්ධන ලබා ගැනීමේදී අනුමත කරඇති ඉන්ධන පිරවුම්හලට අමතරව දිවයිනේ ඕනෑම ඉන්ධන පිරවුම්හලකින් ඉන්ධන ලබා ගැනීමට තීරණය විය.

**<u>යෝජනා අංක 5:10</u>**

මාලිම්බඩ ප්‍රාදේශිය සභාව සඳහා 2023 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද පහත සඳහන් සැලසුම් අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

I. ප්‍රසම්පාදන සැලැස්ම
II. මානව සම්පත් සංවර්ධන සැලැස්ම
III. අභ්‍යන්තර විගණන සැලැස්ම
IV. කසල කළමනාකරණ සැලැස්ම
V. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:10</u>**

මාලිම්බඩ ප්‍රාදේශිය සභාව සඳහා 2023 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද පහත සඳහන් සැලසුම් අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

I. ප්‍රසම්පාදන සැලැස්ම
II. මානව සම්පත් සංවර්ධන සැලැස්ම
III. අභ්‍යන්තර විගණන සැලැස්ම
IV. කසල කළමනාකරණ සැලැස්ම
V. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

**<u>යෝජනා අංක 5:11</u>**

පළාත් පාලන අමාත්‍යාංශ අරමුදල් යටතේ ක්‍රියාත්මක කර දැනට නතර වී ඇති ව්‍යාපෘතිවල ඉතිරි වැඩ සභා අරමුදලින් නිම කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:11</u>**

පළාත් පාලන අමාත්‍යාංශ අරමුදල් යටතේ ක්‍රියාත්මක කර දැනට නතර වී ඇති ව්‍යාපෘතිවල ඉතිරි වැඩ සහා අරමුදලින් නිම කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 5:12</u>**

සුල්තානාගොඩ බටහිර වැව්වේල්ල අසල සිට ඉහළදෙනියවත්ත දක්වා මාර්ගය සංවර්ධනය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:12</u>**

සුල්තානාගොඩ බටහිර වැව්වේල්ල අසල සිට ඉහළදෙනියවත්ත දක්වා මාර්ගය සංවර්ධනය කිරීමට තීරණය විය.

6). යථා පරිදි කල් දී නොමැති යෝජනා.

**<u>යෝජනා අංක 6:1</u>**

ඕගස්පෙ අලවත්තහේන ඉඩමේ පොදු ළිඳ භාවිතයට නොගන්නා නිසා මදුරුවන් බෝවන අතර අපිරිසිදු ළිඳක් බවට දිනෙන් දින පත් වන බැවින් එම ළිඳ වසා තබා ප්‍රාදේශීය සභාවට පවරා ගන්නා ලෙස ප්‍රදේශවාසීන් මා වෙත දන්වා ඇත. මේ සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:1</u>**

ඕගස්පෙ අලවත්තහේන ඉඩමේ පොදු ළිඳ භාවිතයට නොගන්නා නිසා මදුරුවන් බෝවන අතර අපිරිසිදු ළිඳක් බවට දිනෙන් දින පත් වන බැවින් නිවාස සංවර්ධන අධිකාරියෙන් ප්‍රාදේශීය සභාවට පවරාගෙන ඉදිරි කටයුතු කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:2</u>**

WPPF-7353 අංක දරණ කැබ් රථයට මැක්සික්ස් ටයර් 04ක් අලුතින් මිළදී ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:2</u>**

WPPF-7353 අංක දරණ කැබ් රථයට මැක්සික්ස් ටයර් 04ක් අලුතින් මිළදී ගැනීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:3</u>**

මාලිම්බඩ අලවත්තහේන සුසාන භූමි නාම පුවරුව කඩා ඇති බැවින් එය නැවත ප්‍රතිසංස්කරණය කිරීමටත්, ඒ සඳහා රු.21000.00ක වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා

**<u>ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා</u>**

බඩු අරන් දීල වෘත්තීය පුහුණු අධිකාරියෙන් ඉල්ලීමක් කරන්න.එතන පුහුණු වෙන ළමයි ඉන්නවා.නොමිළේ කරගන්න පුළුවන්.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:3</u>**

මාලිම්බඩ අලවත්තහේන සුසාන භූමි නාම පුවරුව කඩා ඇති බැවින් එය නැවත ප්‍රතිසංස්කරණය කිරීමටත්, ඒ සඳහා රු.21000.00ක වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමටත් තීරණය විය.

**<u>යෝජනා අංක 6:4</u>**

2022 වර්ෂයේ වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන වැය ශීර්ෂ සඳහා දැනට ප්‍රතිපාදන ඉතිරි වී ඇති වැය ශීර්ෂ වලින් ප්‍රතිපාදන ලබා ගැනීමට වැය මාරුවක් සඳහා අනුමතිය ලබා දීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:4</u>**

2022 වර්ෂයේ වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන වැය ශීර්ෂ සඳහා දැනට ප්‍රතිපාදන ඉතිරි වී ඇති වැය ශීර්ෂ වලින් ප්‍රතිපාදන ලබා ගැනීමට වැය මාරුවක් සඳහා අනුමතිය ලබා දීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:5</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ස්ථිර සේවක සංඛ්‍යාව 100ක් පමණ සිටින නිසාත්, පොරොත්තු ලේඛනයේ සේවක ණය ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව 2025 මැයි මස දක්වා පවතින නිසාත්, දැනට මසකට ලබා දෙන උපරිම ණය සීමාව රු.250,000.00 ක් වන බැවින් එක් මසකට එක් අයෙකුට පමණක් ණය ලබා දීමට හැකියාව ඇති නිසාත්,මෙම උපරිම ණය සීමාව වැඩි කරමින් මසකට දෙදෙනෙකුට ණය ලබා දීම සඳහා සේවක ණය ගිණුමට රු.500,000.00 ක මුදලක් ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:5</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ස්ථිර සේවක සංඛ්‍යාව 100ක් පමණ සිටින නිසාත්, පොරොත්තු ලේඛනයේ සේවක ණය ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව 2025 මැයි මස දක්වා පවතින නිසාත්,

දැනට මසකට ලබා දෙන උපරිම ණය සීමාව රු.250,000.00 ක් වන බැවින් එක් මසකට එක් අයෙකුට පමණක් ණය ලබා දීමට හැකියාව ඇති නිසාත්,මෙම උපරිම ණය සීමාව වැඩි කරමින් මසකට දෙදෙනෙකුට ණය ලබා දීම සඳහා සේවක ණය ගිණුමට රු.500,000.00 ක මුදලක් ලබා ගැනීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:6</u>**

ගැමුණු මාවත බෝගහ සහ සුල්තානාගොඩ නා ගස සභා අරමුදලින් කපා ඉවත් කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:6</u>**

ගැමුණු මාවත බෝගහ සහ සුල්තානාගොඩ නා ගස සභා අරමුදලින් කපා ඉවත් කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:7</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු ලා නිල් පැහැති යකඩ ජල බවුසරය වෙන්දේසි කිරීමේ මණ්ඩලයට පහත නම් සඳහන් අය සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

- එච්.එච් අසංකා කුමාරි මිය - ලේකම්
- එම්.ඩබ්.ජී.දේශානි දිල්රුක්ෂි මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී
- බී.ඒ.කුමුදු ශාන්ත මයා - තාක්ෂණ නිලධාරි
- ඩී.වාසනා මිය - කළමනාකරණ සේවා නිලධාරි
- එච්.ජී.අශාරා පියුමිණී මිය - ආදායම් පරීක්ෂක

.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:7</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු ලා නිල් පැහැති යකඩ ජල බවුසරය වෙන්දේසි කිරීමේ මණ්ඩලයට පහත නම් සඳහන් අය සුදුසු බවට තීරණය විය.

- එච්.එච් අසංකා කුමාරි මිය - ලේකම්
- එම්.ඩබ්.ජී.දේශානි දිල්රුක්ෂි මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී
- බී.ඒ.කුමුදු ශාන්ත මයා - තාක්ෂණ නිලධාරි
- ඩී.වාසනා මිය - කළමනාකරණ සේවා නිලධාරි
- එච්.ජී.අශාරා පියුමිණී මිය - ආදායම් පරීක්ෂක

.

**<u>යෝජනා අංක 6:8</u>**

කියවීමේ මාසය වෙනුවෙන් මාලිම්බඩ ප්‍රාදේශීය සභා පුස්තකාල මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පහත වැඩ සටහන් සහ ඒ සඳහා වන වියදම් ඇස්තමේන්තු ගරු සභාවේ අනුමැතියට ඉදිරිපත් කරමි.

**1.**කතන්දර පැය වැඩසටහන

**ඇස්තමේන්තුගත වැය විස්තරය**

| | | |
|---|---|---|
| සම්පත් දායක ගාස්තුව | = | 2000.00 |
| ත්‍යාග | = | 6000.00 |
| සහතික පත්‍ර | = | 6000.00 |
| **එකතුව** | **=** | **14000.00** |

**2. ගීත රසවින්දන වැඩසටහන**
**ඇස්තමේන්තුගත වැය විස්තරය**

| | | |
|---|---|---|
| සම්පත් දායක ගාස්තු | = | 5000.00 |
| සංගීත භාණ්ඩ බද්දට ලබා ගැනීම | = | 5000.00 |
| **එකතුව** | **=** | **10000.00** |

**3. ඩිවි දශම වර්ගීකරණය අනුව පාසල් පුස්තකාල සකස්කර දීම**

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණය අංක 6:8**
කියවීමේ මාසය වෙනුවෙන් මාලිම්බඩ ප්‍රාදේශීය සභා පුස්තකාල මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත පහත වැඩ සටහන් සහ ඒ සඳහා වන වියදම් ඇස්තමේන්තු අනුමත කිරීමට තීරණය විය

**1.කතන්දර පැය වැඩසටහන**

**ඇස්තමේන්තුගත වැය විස්තරය**

| | | |
|---|---|---|
| සම්පත් දායක ගාස්තුව | = | 2000.00 |
| ත්‍යාග | = | 6000.00 |
| සහතික පත්‍ර | = | 6000.00 |
| **එකතුව** | **=** | **14000.00** |

**2. ගීත රසවින්දන වැඩසටහන**

**ඇස්තමේන්තුගත වැය විස්තරය**

සම්පත් දායක ගාස්තු = 5000.00

සංගීත භාණ්ඩ බද්දට ලබා ගැනීම = 5000.00

**එකතුව** **=** **10000.00**

**3. ඩිවි දශම වර්ගීකරණය අනුව පාසල් පුස්තකාල සකස්කර දීම**

**යෝජනා අංක 6:9**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක පුස්තකාල සඳහා 2022 වර්ෂය වෙනුවෙන් පොත් මිලදී ගැනීමේදී ඒ ඒ පුස්තකාලයන් සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

තෙලිජ්ජවිල මහජන පුස්තකාලයට = රු. 250000.00

මාලිම්බඩ මහජන පුස්තකාලයට = රු.150000.00

ජංගම පුස්තකාලයට = රු.100000.00

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී.පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:9**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක පුස්තකාල සඳහා 2022 වර්ෂය වෙනුවෙන් පොත් මිලදී ගැනීමේදී ඒ ඒ පුස්තකාලයන් සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය අනුමත කිරීමට තීරණය විය.

තෙලිජ්ජවිල මහජන පුස්තකාලයට = රු.250000.00

මාලිම්බඩ මහජන පුස්තකාලයට = රු.150000.00

ජංගම පුස්තකාලයට = රු.100000.00

**යෝජනා අංක 6:10**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ වීථි පහන් නඩත්තු කටයුතු සඳහා යොදා ගන්නා ෆයිබර් ඉනිමග අබලන් තත්ත්වයේ පවතින බැවින් අලුතින් ඉනිමගක් මිළදී ගැනීමටත්, වීථි පහන් නඩත්තුව සඳහා අවශ්‍ය වන G.I බ්‍රැකට් සෙට් 100 ක් සහ 1/1.3 වයර් කොයිල් 10 ක් ලබා දීමටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:10</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ වීථි පහන් නඩත්තු කටයුතු සඳහා යොදා ගන්නා ෆයිබර් ඉනිමග අබලන් තත්ත්වයේ පවතින බැවින් අල්තින් ඉනිමගක් මිළදී ගැනීමටත්, වීථි පහන් නඩත්තුව සඳහා අවශ්‍ය වන G.I බ්‍රැකට් සෙට් 100 ක් සහ 1/1.3 වයර් කොයිල් 10 ක් ලබා දීමටත් තීරණය විය.

**<u>යෝජනා අංක 6:11</u>**

අකුරුගොඩ, සුල්තානාගොඩ රන්තරු පෙර පාසලේ වහලයෙන් පෙර පාසල ඇතුළට ජලය කාන්දු වී දරුවන්ගේ ඉගෙනීම් කටයුතුවලට බාධා සිදුවන බැවින් එහි වහලය සකස් කර දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:11</u>**

අකුරුගොඩ, සුල්තානාගොඩ රන්තරු පෙර පාසලේ වහලයෙන් පෙර පාසල ඇතුළට ජලය කාන්දු වී දරුවන්ගේ ඉගෙනීම් කටයුතුවලට බාධා සිදුවන බැවින් එහි වහලය සකස් කර දීම සුදුසු බවට තීරණය විය.

**<u>යෝජනා අංක 6:12</u>**

මාතර දිස්ත්‍රික්කයේ පිහිටි මාලිම්බඩ ප්‍රාදේශීය සභාව භුක්ති විඳින රිලාමුල්ල හේන හෙවත් පිටිවල හේන සහ අධිකාරිවිලවත්ත සුසාන භූමි ඉඩම් කොටස් ප්‍රාදේශීය සභාව වෙත පවරා දීම වෙනුවෙන් "සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව" වෙත රු.22,368.00ක් ගෙවීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:12</u>**

මාතර දිස්ත්‍රික්කයේ පිහිටි මාලිම්බඩ ප්‍රාදේශීය සභාව භුක්ති විඳින රිලාමුල්ල හේන හෙවත් පිටිවල හේන සහ අධිකාරිවිලවත්ත සුසාන භූමි ඉඩම් කොටස් ප්‍රාදේශීය සභාව වෙත පවරා දීම වෙනුවෙන් "සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව" වෙත රු.22,368.00ක් ගෙවීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:13</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයට අළුතින් ජෙනරේටරයක් මිළදී ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද පිරිවිතර සහ දළ ඇස්තමේන්තුව අනුමත කිරීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

රටෙහි පවත්නා ආර්ථික අර්බුද තත්ත්වය සලකා මෙම අවස්ථාවේදී මෙම මිළදී ගැනීම සිදු නොකිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:14</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සහ තවත් ආයතන සම්බන්ධීකරණය කරමින් මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ආහාර විජලන යන්ත්‍ර ලබාදීමේ වැඩසටහන යටතේ තෝරාගත් ග්‍රාම නිලධාරී වසම් 06කට විජලන යන්ත්‍ර 06ක් ලබා දීමටත් ඒ සඳහා වන රු.1,800,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීමටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

**ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා**

ප්‍රජා මණ්ඩලවලට දීල සභාව මගින් අධීක්ෂණය කරමු.

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:14**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සහ තවත් ආයතන සම්බන්ධීකරණය කරමින් මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරනු ලබන ආහාර විජලන යන්ත්‍ර ලබාදීමේ වැඩසටහන යටතේ තෝරාගත් ග්‍රාම නිලධාරී වසම් 06කට විජලන යන්ත්‍ර 06ක් ලබා දීමටත් ඒ සඳහා වන රු.1,800,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීමටත් තීරණය විය.

**යෝජනා අංක 6:15**

හොරගොඩ අලපලාව පාර අවහිරවීමෙන් ගොවීන් දැඩි අපහසුතාවකට පත්ව ඇති බැවින් 2019 වසරේ දකුණු පළාත් සභා මන්ත්‍රී ගරු මනෝජ් සිරිසේන මැතිතුමා විසින් වෙන්කරන ලද මුදල් යොදවා එම අවහිරතා ඉවත් කර පස් දමා සංවර්ධනය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා
ස්ථිර කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:15**

හොරගොඩ අලපලාව පාර අවහිරවීමෙන් ගොවීන් දැඩි අපහසුතාවකට පත්ව ඇති බැවින් 2019 වසරේ දකුණු පළාත් සභා මන්ත්‍රී ගරු මනෝජ් සිරිසේන මැතිතුමා විසින් වෙන්කරන ලද මුදල් යොදවා එම අවහිරතා ඉවත් කර පස් දමා සංවර්ධනය කිරීමට තීරණය විය.

**යෝජනා අංක 6:16**

මාරගොඩ ග්‍රාම නිලධාරී වසමට අයත් කොටදූපයාය උඩුකුඹුරේ සිට දිවෙන ඇළ මාර්ගය පරාටියවල දක්වා සංවර්ධනය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:16**

මාරගොඩ ග්‍රාම නිලධාරී වසමට අයත් කොටදූපයාය උඩුකුඹුරේ සිට දිවෙන ඇළ මාර්ගය පරාටියවල දක්වා සංවර්ධනය කිරීමට තීරණය විය.

**යෝජනා අංක 6:17**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අධිකාරිවිලගම ප්‍රජා ශාලාවට ජලය සහ විදුලිය සභා අරමුදලින් ලබා දීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:17</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අධිකාරිවිලගම ප්‍රජා ශාලාවට ජලය සහ විදුලිය සභා අරමුදලින් ලබා දීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:18</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අධිකාරිවිලගම පුබුදු පෙර පාසලේ සෙල්ලම් මිදුල සභා අරමුදලින් සකස් කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ස්ථිර කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:18</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අධිකාරිවිලගම පුබුදු පෙර පාසලේ සෙල්ලම් මිදුල සභා අරමුදලින් සකස් කිරීමට තීරණය විය.

**<u>යෝජනා අංක 6:19</u>**

ජීවන වියදම් ඉහළ යාම මත ඒ.වී.අමිල් උෂාන්ත මහතාට ලබා දෙන දීමනාව ප්‍රමාණවත් නොවීමත් , සම මට්ටමේ රියදුරන් ඉහළ වැටුපක් ලැබීමත් සලකා සභාවේ සිටින එකම බැකෝ ලෝඩර් ක්‍රියාකරු ඔහු නිසාත්, හදිසි ආපදා අවස්ථාවලදී සහ මාර්ග සංවර්ධනයේදී අති මහත් සේවාවක් මොහු විසින් සිදුකරන නිසාත් , මෙම රියදුරුගේ දෛනික දීමනාව දිස්ත්‍රික් මිළ ගණන් කමිටු වාර්තාවට අනුව ලබාදිය හැකි අවම දීමනාව ලබා දීමට යෝජනා සම්මත කර පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇත. ඒ අනුව පළාත් පාලන කොමසාරිස්ගේ අංක 01/03/08 සහ 2022.08.31 දිනැති ලිපිය මගින් දිස්ත්‍රික් මිල කමිටු වාර්තාවට අනුව බැකෝ ලෝඩර් ක්‍රියාකරුවෙකුට එක් දිනක් සඳහා අනුමත මිල රු.4465.00ක් බවත්, සභා අරමුදලින් ගෙවීම් කිරීමට හැකියාවක් පවතින්නේ නම් පමණක් දිස්ත්‍රික් මිල කමිටු වාර්තාවෙහි මිළ ගණන් නොඉක්මවන පරිදි සභාව තීරණය කරන මුදලක් දෛනික වැටුප් ලෙස ගෙවන ලෙස දන්වා ඇත. ඒ අනුව 2022 සැප්තැම්බර් මස සිට බැකෝ ලෝඩර් ක්‍රියාකරුගේ දෛනික වැටුප රු.2500.00ක් දක්වා වැඩි කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:19</u>**

ජීවන වියදම් ඉහළ යාම මත ඒ.වී.අමිල් උෂාන්ත මහතාට ලබා දෙන දීමනාව ප්‍රමාණවත් නොවීමත් , සම මට්ටමේ රියදුරන් ඉහළ වැටුපක් ලැබීමත් සලකා සභාවේ සිටින එකම බැකෝ ලෝඩර් ක්‍රියාකරු ඔහු නිසාත්, හදිසි ආපදා අවස්ථාවලදී සහ මාර්ග සංවර්ධනයේදී අති මහත් සේවාවක් මොහු විසින් සිදුකරන නිසාත් , මෙම රියදුරුගේ දෛනික දීමනාව දිස්ත්‍රික් මිළ ගණන් කමිටු වාර්තාවට අනුව ලබාදිය හැකි අවම දීමනාව ලබා දීමට යෝජනා සම්මත කර පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇත. ඒ අනුව පළාත් පාලන

කොමසාරිස්ගේ අංක 01/03/08 සහ 2022.08.31 දිනැති ලිපිය මගින් දිස්ත්‍රික් මිල කමිටු වාර්තාවට අනුව බැකෝ ලෝඩර් ක්‍රියාකරුවෙකුට එක් දිනක් සඳහා අනුමත මිල රු.4465.00ක් බවත්, සහා අරමුදලින් ගෙවීම් කිරීමට හැකියාවක් පවතින්නේ නම් පමණක් දිස්ත්‍රික් මිල කමිටු වාර්තාවෙහි මිළ ගණන් නොඉක්මවන පරිදි සභාව තීරණය කරන මුදලක් දෛනික වැටුප් ලෙස ගෙවන ලෙස දන්වා ඇත.ඒ අනුව 2022 සැප්තැම්බර් මස සිට බැකෝ ලෝඩර් ක්‍රියාකරුගේ දෛනික වැටුප රු.2500.00ක් දක්වා වැඩි කිරීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:20</u>**

ජපන් භාෂා පුහුණු පාඨමාලාවේ දේශකවරයා වන ආදදොළුවේ ධර්මසිරි ස්වාමීන් වහන්සේ සඳහා දේශන පැයකට රු.1000.00 බැගින් ගාස්තු ගෙවීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:20</u>**

ජපන් භාෂා පුහුණු පාඨමාලාවේ දේශකවරයා වන ආදදොළුවේ ධර්මසිරි ස්වාමීන් වහන්සේ සඳහා දේශන පැයකට රු.1000.00 බැගින් ගාස්තු ගෙවීමට තීරණය විය.

**_7). කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම.**

2022/08/26 දින පැවති ටෙන්ඩර් කමිටු වාර්තාව සභාව වෙත ඉදිරිපත් කිරීම

**8). ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම.**

2022 ජනවාරි සිට 2022 ජූලි දක්වා ලැබීම් හා ගෙවීම් සාරාංශ වාර්තා සභාව වෙත ඉදිරිපත් කිරීම.

**9). වෙනත් කරුණු- නැත.**

සභාපතිතුමාගේ ස්තුති කථාවෙන් පසු ප.ව. 3.00 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව